අහෝ රුවෙයිෆඃ! ජීවිතය ඔබට දීර්ගවනු ඇතැයි පෙනේ. තම රැවුල ගෙට ගසා සකසන්නන් හෝ මාල පළදින්නන් හෝ සත්ව අසූචි හා අස්ථිවලින් පිරිසිදු කරගන්නන්හට දන්වනු. සැබැවින්ම මුහම්මද් ඉන් නිදහස් අයෙකි.

අල්ලාහ්ගේ දූතයාණන් මට මෙසේ පැවසීය යැයි පවසමින් රුවෙයිෆඃ තුමා විසින් මෙසේ
වාර්තා කරන ලදී. “අහෝ රුවෙයිෆඃ! ජීවිතය ඔබට දීර්ගවනු ඇතැයි පෙනේ. තම රැවුල ගෙට ගසා සකසන්නන් හෝ මාල පළදින්නන් හෝ සත්ව අසූචි හා අස්ථිවලින් පිරිසිදු කරගන්නන්හට සැබැවින්ම මුහම්මද් ඉන් නිදහස් අයෙකි යැයි දන්වනු.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ පිළිවෙතට විරුද්ධව කටයුතු කරන පිරිසක් මුණ ගැසෙන තුරු සැබැවින්ම එම සහාබිවරයාගේ ජීවිත කාලය ඔහුට දීර්ග වන බව එතුමාණෝ දන්වා සිටියේය. රැවුල සම්බන්ධයෙන් නම් එය පූර්ණ ලෙස වැවීම පිටස්තරයන්ට හෝ සැප පහසුකම් ඇති සුඛෝපභෝගි ජීවිතයක් ගත කරන්නන්හට අනුකූලව එය විකෘති කරමින් එයට සාත්තු කිරීමය. එසේ නැතහොත් දේවත්වයට ආදේශ තබන මාධ්යයන් භාවිතා කරමින් ඒකදේව වාදී ප්රතිපත්තිය විකෘති කොට මාල පැළඳ එවා ඔවුන්ගේ සතුන්ටත් පළන්දවා එමගින් අනතුරු වළක්වාගන්නට බැලීමය. එසේ නැතහොත් සත්ව අසූචි හා අස්ථි තුළින් පිරිසිදු කිරීම වැනි ඔවුන්ගේ නබිවරයා ඔවුනට තහනම් කළ දෑ සිදු කිරීමය. ඒ අනුව (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම මිතුරාට එවන් සමූහයක් දකිනු ඇතැයි ද එවන් කිසිවක් සිදු කරන්නන්ගෙන් නබිවරයා නිදොස් බවද දන්වා උපදෙස් දුන්හ.

https://sunnah.global/hadeeth/si/show/6764